**රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2023**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය හා මුදල් රෙගුලාසි 134(3) | විද්‍යායතනය ආරම්භ කළ 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක විසින් විද්‍යායතනයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි. | 2024 පෙබරවාරි 15 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ දී පැවැත් වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී විශ්වවිද්‍යාල විද්‍යායතනයේද අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කළ යුතු බව | අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සහ රජය සතු ව්‍යවසායන් (SOEs) සඳහා වන මෙහෙයුම් අත්පොත | | | |
| (i) | 4.2(ඌ) වගන්තිය | යම් වර්ෂයක් තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ විද්‍යායතනය විසින් එවැනි රැස්වීම් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී විගණන කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව. | විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 6.6 වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා විගණන වාර්තාද ඇතුළත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් විද්‍යායතනය ආරම්භ කළ 2016 වර්ෂයේ සිට | ඉදිරියේදී වාර්ෂික වාර්තාව සභාගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරනු ලබන බව. | වාර්ෂික වාර්තා නියමිත කාල සීමාව තුළ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය දක්වාම එම වාර්තා සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | | යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 35,500,266 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 30,291,210 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,209,056 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවා වියදම් සහ ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනයේ අත්පොතට අනුව ඉටුකළ යුතු කාර්යයන් 19 ක් දක්වා තිබුණද විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටුවන ලද 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වසර 08 ක් පමණ ගතවී තිබුණද ඉන් කාර්යයන් 7 ක් ඉටු කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි. | දැනට පවත්නා සේවක හිඟය හේතුවෙන් එම ක්‍රියාකාරකම් සඳහා අවධානය යොමු කිරීම ඉතා අපහසු වුවත් මෙම වසරේ සිට මීට අදාල කටයුතු කිහිපයක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව. | විද්‍යායතනය විසින් ඉටුකළ යුතු සියළු කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015/2018, 2016/2019, 2017/2020 හා 2018/2021 කණ්ඩායම්වලට අදාළව ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 127, 218, 245 හා 237 ක් වූ අතර ඒ අතරින් පාඨමාලා සම්පූර්ණ නොකර අතරමග හැරගිය සිසුන් ප්‍රමාණය පිළිවෙලින් 11, 45, 69 හා 99 ක් ලෙස අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එම තත්ත්වය අවම කර සිසුන් විද්‍යායතනය තුල රඳවාගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | යම් සිසුන් කණ්ඩායමක සිසුවෙකුට පාඨමාලාව පළමු අවස්ථාවේදීම සම්පූර්ණ කිරීමට නොහැකි වුවහොත් ඊළඟ වර්ෂයේදී පාඨමාලාව සම්පූර්ණ කල හැකි අතර ඒ අනුව පාඨමාලා සම්පූර්ණ කරන ලද ප්‍රතිශත විවිධ වන බව | සිසුන් පාඨමාලා හැරයාමට හේතු වන කරුණු සොයා බලා ඒවාට අවශ්‍ය පිළියම් යොදා සිසුන් පාඨමාලා සම්පූර්ණ කිරීම සඳහා රඳවා ගැනීමට අවශ්‍යය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2023 වර්ෂයේ පවත්වන ලද විභාග 16 කට අදාළව විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී සිසුන් විභාග සඳහා අයදුම් කර ඒ සඳහා සහභාගී නොවීම හා අදාළ කාර්යය පැවරුම් සම්පූර්ණ නොකිරීම සියයට 32 සිට සියයට 68 දක්වා වූ ඉහළ පරාසයක පැවතුණි. මෙම තත්ත්වය අවම කර නිසි පරිදි අදාළ විභාග සම්පූර්ණ කිරීම සඳහා සිසුන් යොමු කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් කළමනාකරණය විසින් යොමුකර නොතිබුණි. | ඇතැම් මොඩියුල අදාල NVQ අධ්‍යයන පාඨමාලාවේ ප්‍රධාන විෂය කෙෂ්ත්‍රයට බාහිර විෂයන්ගේ ප්‍රථිපල අඩුවීම් බොහෝ විට දක්නට ලැබෙන බව. | පාඨමාලාවලට අදාල ලිඛිත පැවරුම් සම්පූර්ණ කිරීමට සිසුන් උනන්දු කිරීමට අවශ්‍යය කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) බාහිර කථිකාචාර්යවරුන් විසින් සම්පූර්ණ කරන ලද දේශන පැය පිළිබඳව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී, සමාලෝචිත වර්ෂය තුළදී විෂයයන් 57 කට අදාළව සැලසුම් කරන ලද පැය ගණනට සාපේක්ෂව සම්පූර්ණ කරන ලද පැය ගණන සියයට 50 ට වඩා අඩු වූ විෂයයන් 17 ක් පැවතුණි. | සංශෝධනය කරන ලද දේශන පැවැත් වූ පැය ගණන පිළිබඳ දැක්වෙන සාරාංශයන්ට අනුව සැලසුම් කරන ලද පැය ගණන හා සම්පූර්ණ කරන ලද පැය ගණන අතර වෙනසට විවිධ හේතුන් පවතින බව. | බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් සැලසුම් කරන ලද දේශන පැය ප්‍රමාණය සම්පූර්ණයෙන් ඉටුකරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආහාර තාක්ෂණ විද්‍යාගාරයෙහි පාඨමාලා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් හා පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා පාඨමාලා නොපැවැත්වීම හේතුවෙන් එම විද්‍යාගාරය තුළ පැවති එකතු වටිනාකම රු.2,937,996 ක් වූ විද්‍යාගාර උපකරණ 2015 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2024 පෙබරවාරි 06 දින වන විටත් භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ආහාර තාක්ෂණවේදය පාඨමාලාවේ විද්‍යාගාරය නවීකරණය කිරීම සඳහා අදාළ ප්‍රසම්පාදන කටයුතු කරගෙන යාමට අවස්ථා කිහිපයකදී උත්සහ දැරුවද සුදුසු ඉල්ලුම්කරුවෙකු ඉදිරිපත් නොවීම සහ ඒ ඒ අවස්ථාවන්වලදී ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම යන කරුණු හේතුවෙන් එම අවස්ථා සාර්ථක කර ගැනීමට නොහැකි වූ බව. | අවශ්‍ය පහසුකම් සම්පූර්ණ කරගෙන නිෂ්කාර්යව පවතින උපකරණ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විද්‍යායතනයේ අත්‍යාවශ්‍යම තනතුරු 03 ක් වන අධ්‍යක්ෂ, සහකාර ලේඛකාධිකාරී හා සහකාර මූල්‍යාධිකාරී යන තනතුරු සමාලෝචිත වර්ෂයේ මාර්තු සහ ඔක්තෝබර් මාසවල සිට පුරප්පාඩු | පවතින පුරප්පාඩු පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කර එම පුරප්පාඩු පිරවීම සම්බන්ධව අනුමැතිය ලබාගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2024 ජනවාරි ලිපියක් යොමුකර ඇති නමුත් ඒ සඳහා අනුමැතිය ලැබී | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වීම හේතුවෙන් එහි පරිපාලනය කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යැමට අහිතකර ලෙස බලපා තිබුණි. | නොමැති බව. | |
| (ආ) | විද්‍යායතනය විසින් පවත්වාගෙන යනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම (NVQ Level) 05 හා 06 මට්ටමේ එක් පාඨමාලාවක් සඳහා අවම වශයෙන් කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බැගින් සිටිය යුතු වුවද ඉකුත් හා සමාලෝචිත වර්ෂය අතර කාලය තුළදී පාඨමාලා 05 ක් සඳහා එක් කථිකාචාර්යවරයෙකු බැගින් පමණක් සේවයේ යොදවා සිටි අතර විදුලි තාක්ෂණය පාඨමාලාව වෙනුවෙන් එක් කථිකාචාර්යවරයෙකු හෝ සේවයේ යොදවා නොතිබුණි. | දැනට පවතින පුරප්පාඩු පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර අමාත්‍යාංශය මඟින් පවතින පුරප්පාඩු පිරවීම සම්බන්ධව අනුමැතිය ලබාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2024 ජනවාරි ලිපියක් යොමු කර ඇති නමුත් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බව. | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |